කොවිඩ් -19 සති පාසල සබරගමුව

විෂයය - සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
9 ශ්‍රේණිය

ජනවාරි 01 වන සතිය

පාඩම -01. සෞඛ්‍යයවත් සමාජයක් ගොඩනගමු

අවට සිටින පුද්ගලයන් සහ අවට පරිසරයේ අප අයත් සමාජයේ කොටස් ලෙස සැලකේ. සමාජය තුළ ජීවත් වන පුද්ගලයෝ විවිධ වෙනස්කම් වලින් යුක්ත වෙති.

සමාජයේ පුද්ගල විවිධතා වලට හේතු

- විවිධ වයස් මට්ටම්
- විවිධ ආර්ථික තත්ත්ව
- විවිධ ආගම්
- විවිධ රැකියාවන්
- විවිධ දක්ෂතා
- විවිධ රුචි අරුචිකම්
- විවිධ ජාතීන්

අප ජීවත් වන සමාජයේ ඇතිවන සෞඛ්‍ය ගැටලු

- පරිසර දූෂණය
- බෝවන රෝග හා බෝ නොවන රෝග
- මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය
- අනතුරු හා ආපදා
- අපචාර හා අපයෝජන

01 පරිසර දූෂණය - අප ජීවත් වන වටපිටාව මිනිසාගේ මෙන්ම සත්වයන්ගේ වාසයට නුසුදුසු තත්ත්වයට පත්වීම පරිසර දූෂණය නම් වේ.

02 වායු දූෂණය - අහිතකර සහ විස සහිත සංඝටක වලින් වායුගෝලයේ සංයුතිය වෙනස්වීම වායු දූෂණය ලෙස හැඳින්විය හැකිය.

03 ජල දූෂණය - විෂ සහිත හෝ හානිකර ද්‍රව්‍ය එක් වීමෙන් භාවිතයට ගත නොහැකි ලෙස ජලයේ සාමාන්‍ය ස්භාවය වෙනස්වීම ජල දූෂණය නම් වේ.

04 භූමි දූෂණය - භූමියේ ස්භාවික තත්ත්වය වෙනස් වී භූමිය පරිහරණයට ගැනීමට නොහැකි අන්දමට වෙනස් වීම භූමි දූෂණය නම් වේ.

05 ශබ්ද දූෂණය - මිනිසාගේ කනට දැරිය නොහැකි තීව්‍රතාවයකින් යුක්තව ශබ්ද නිකුත්වීම ශබ්ද දූෂණය නම් වේ.

ක්‍රියාකාරකම

01 පරිසර දුෂණයට ලක් වන අංග මොනවාද ?

02 වායු දුෂණය මගින් ඇති වන රෝග තුනක් සදහන් කරන්න.

03 ජල දුෂණය නිසා ඇතිවන රෝග හතරක් සදහන් කරන්න .

04 භූමි දුෂණයේ අහිතකර ප්‍රතිඵල හතරක් ලියන්න .

05 ශබ්ද දුෂණය මගින් ඇතිවන අහිතකර ප්‍රතිඵල හතරක් ලියන්න .

06 පරිසර දුෂණයට හේතුවන වන සාධක හතරක් සදහන් කරන්න.

07 පරිසර දුෂණය වැලක්විමට ගත හැකි යෝජනා ඉදිරිපත් කරන්න .